ක්‍රියාවලිය :

පියවර 1: සේවකයා විසින් තහවුරු කිරීමේ ලේඛනයේ ඇති සියලු තොරතුරු නිසි පරිදි පුරවා **පැහැදිලි ස්කෑන් පිටපතක්** EPS මධ්‍යස්ථානයට විද්‍යුත් තැපෑලෙන් යොමු කල යුතුය. epscenterlk@yahoo.com [ආකෘති පත්‍රයට අවශ්‍ය තොරතුරු නිවැරදිව ඇතුළු කර තිබිය යුතු බව කරුණාවෙන් සලකන්න, උදා: කොරියාවේ ලිපිනය, කොරියාවේ ජංගම දුරකථන අංකය.... .. ආදිය].

***නිරෝධායන කාලය (දින 14) තුල තනිව පරිහරණය කල හැකි වෙනම ම ස්ථානයක්/කාමරයක් ඔබ වෙනුවෙන් කොරියාවේ තිබිය යුතු අතර එම ස්ථානය කිසිදු ආකාරයකින් සමූහ ලෙස භාවිතා නොහැක. තවද එම ස්ථානය, තනිව පරිහරණය කල හැකි වැසිකිළි සහ නාන කාමර පහසුකම් සහිත ස්ථානයක් විය යුතුය.

පියවර 2:

සේවකයා විසින් ලබා දී ඇති නිරෝධායන පහසුකම් තොරතුරු සත්‍යාපනය සඳහා (නිරද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා) තොරතුරු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනයේ කොරියාවේ ප්‍රධාන කාර්යාලය සමඟ හුවමාරු වේ.

පියවර 3:

කොරියාවේ මානව සම්පත් සංවර්ධන සේවා ආයතනයේ ප්‍රධාන කාර්යාලය විසින් තොරතුරු සත්‍යාපනය කළ පසු, ශ්‍රී ලංකාවේ EPS මධ්‍යස්ථානය ඔබ හා සම්බන්ධ වනු ඇත.